මාර්ගගත දැන්වීම

**ජාතික අධ්‍යාපන ආයතනය මහරගම**
**අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2026**
# Diploma in Educational Research Methodology
# SLQF Level – III

ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන උක්ත පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පාඨමාලාවේ ස්වභාවය**

- අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව අධ්‍යයන සම්භාර 30කින් යුක්ත එක් අවුරුදු සති අන්ත අර්ධ කාලීන පාඨමාලාවකි.
- සම්මිශ්‍රිත ක්‍රමය අනුව සම්මුඛ සැසි මගින් (40%) හා මාර්ගගත ව (60%) පවත්වනු ලබන මෙම පාඨමාලාව අධ්‍යයන වාර දෙකකින් සමන්විත ය.
- සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පාඨමාලාව පැවැත්වේ.

**02. අයදුම් කිරීම සඳහා සුදුසුකම්**

- රාජ්‍ය/අර්ධ රාජ්‍ය/පෞද්ගලික අධ්‍යාපන ආයතනයක (පාසල්, පිරිවෙන්, ජාත්‍යන්තර පාසල්) හෝ වෙනත් පිළිගත් අධ්‍යාපන ආයතනයක විදුහල්පතිවරයෙකු /ගුරුවරයෙකු වීම හෝ,
- SLEAS හෝ SLTES නිලධාරියෙකු, ISA, ජ්‍යෙෂ්ඨ ගුරු උපදේශකයෙකු, හෝ,
- ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු වීම හෝ,
- ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු වීම හෝ
- අධ්‍යාපන පර්යේෂණ සඳහා උනන්දුවක් දක්වන වෙනත් ඕනෑම ශාස්ත්‍රඥයෙකු වීම

සහ

- අ.පො.ස. (උසස් පෙළ) විෂයන් 03 ක් එකවර සමත්වීම

**03. පාඨමාලාව සඳහා තෝරා ගැනීම**

- පාඨමාලාලාභීන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.

**04. ගාස්තු**

අයදුම්පත් සඳහා : රුපියල් 500/-
ලියාපදිංචි ගාස්තු : රුපියල් 2,000/-
පාඨමාලා ගාස්තු : රුපියල් 50,000/- (මෙය අවස්ථා දෙකක දී සමාන වාරිකවලින් ගෙවිය හැකි ය).

**05. පාඨමාලාව පැවැත්වෙන ස්ථානය :** ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

**06. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

- ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිස පාඨමාලාව සඳහා අයදුම්පත් යොමු කළ යුතු ය. https://www.exams.nie.lk/intakes/new
- අයදුම්පත් යොමු කිරීමේ දි පහත සඳහන් පියවර අනුගමනය කරන්න.

  - https://www.exams.nie.lk/intakes/new වෙබ් අඩවියට ප්‍රවේශ වී (sign up) අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න. එහිදී ඔබට ලැබෙන පරිශීලක අංකය (User ID) සටහන් කර තබා ගන්න. අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මුරපදය (Password) සටහන් කර තබා ගන්න.

- වෙබ් අඩවියේ දකුණු පස ඉහළ දැක්වෙන කොටු දෙකෙහි පරිශීලක අංකය හා මුරපදය යොදා ඇතුළත් වන්න (Log in).

- ඔබ පිළිබඳ තොරතුරු (User profile) සම්පූර්ණ කරන්න,

- නව ප්‍රවේශ (New enrollment) වෙත පිවිසෙන්න.

- ඔබට නියමිත පාඨමාලාවේ අයදුම්පත්‍රයට ප්‍රවේශ වන්න (My application).

- අදියර 2හි (STEP 2 payment) සඳහා ප්‍රවේශ වන්න. මෙහිදී ඔබ වෙත ලැබෙන ගෙවීම් යොමු අංකය (Payment reference number) යොදා දක්වා ඇති ගිණුමට අයදුම්පත්‍ර ගාස්තුව වන රු.500/- මුදල ගෙවන්න.

- මුදල් ගෙවන ලද රිසිට් පත ස්කෑන් කර ගෙවීම් දිනය හා යොමු අංකය (Transaction reference number) ඇතුළත් කරන්න.

- ඔබට ලැබෙන පරිශීලක අංකය (Application reference number) සටහන් කර තබා ගන්න,

- වැඩිදුර විස්තර සඳහා **0117601863/ 0117601790/ 0117601794**, දුරකථන අංකයන්ට සතියේ දිනවල (පෙ.ව.9.00 සිට ප.ව. 4.00 දක්වා ) අමතා සහාය ලබා ගත හැකි ය. අයදුම්පත් යොමු කිරීමේ තාක්ෂණික ගැටලු සඳහා **0117601776 / 0117601777** අමතා සහාය ලබා ගත හැකි ය.
- ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබුනහොත් පාඨමාලාව පවත්වනු නොලැබේ.

07. **අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය** - 2026/07/31

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.